# අකීකරු අලි පැටවා



සෙතුම් හෙසන්‍යා බණ්ඩාර

කෘතියේ නම - අකීකරු අලි පැංචා

ISBN NO - 978-624-208-025-3

කතෘ - කේ.එම් සෙතුමි හෙසන්යා බණ්ඩාර

මුද්‍රිත දිනය - 2023/12/10

කතෘගේ වෙනත් කෘති - සදිනිට පාඩමක්

ISBN NO - 978-624-206-152-8

පාසල - මහාමායා බාලිකා විදුහල

# පිදුම

මෙම නිර්මාණය ගොඩනැංවීමේදී දිරි
ගැන්වූ මාගේ දෙමාපියන්ට මා පළමුව
ස්තුතිය පුද කරමි.තවද නිවැරදි දැක්මට
හා මඟ පෑදීමට උරදුන් මාගේ පන්තිභාර
ගුරුතුමිය සහ අපගේ විදුහල්පතිනිය ශෂිකලා
සේනාධීර ගුරු මැණියන්ටත් හදපිරි ස්තූතිය
පුදකරමි.

මෙම නිර්මාණයේදී පූර්ණ සහයෝගය ලබාදුන්
ව්‍යාපෘති නිර්මාණ සම්බන්ධිකාරක සෙනෙවිරත්න
ගුරු පියාණන්හටත්, නිර්මාණය තැනීමේදී මා
ධෛර්යමත් කල හා නන් අයුරින් සහය
දුන් පුද්ගලයන්ටද තුති මල් විකසිත කරමින්
ගෞරවයෙන් පුදනෙමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර<br>
විදුහල්පතිනිය<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර<br>
2023-10-20

ඔන්න එකමත් එක රටක ලස්සන වනාන්තරයක පුංචි අලි පවුලක් ජීවත් වුණා. මේ රැලේ සිටිය පුංචි අලි පුතානම් හරිම අකීකරුයි. ඒ විතරක් නෙමෙයි හරිම මුරණ්ඩුයි.

කවදාවත්ම එයාගේ අම්මයි තාත්තයි කියපු කිසිම දෙයක් ගාණකටවත් ගත්තේ නෑ.



ඔන්න එක් දිනක් මේ අලි අම්මයි තාත්තයි කෑම සොයාගෙන ඒමට වනය බලා පිටත් වීමට සුදානම් වුණා. පසුව අලි පැංචාට කතා කර මෙසේ කීවා පුතේ... අම්මයි මමයි කැලයට යනවා ඔයත් එනවද අපිත් එක්ක යන්න.

අනේ... මට බෑ අම්මේ මට හරිම කම්මැලියි. මම අම්මලා එනකම් ගෙදරට වෙලා ඉන්නම් අලි පැංචා අම්මාට කීවා.

හ්ම්... හොඳයි එහෙනම් මගේ පුතා අපි එනකම් පරිස්සමට ගෙදරට වෙලා ඉන්න ඕනි . දඟ වැඩ කරනවා නෙමෙයි හැබැයි. අලි අම්මා පැංචාට කීවා.

අවස්ථාවක් එනතුරු බලා සිටි අලි පැංචා හොරෙන්ම ගෙදරින් පැනගත්තා.


පසුව  පුංචි අලි පැංචා තමාටම  මෙසේ කියා ගත්තා.

ෂා... මේ දවස එනතුරු මම කොතරම් බලා සිටියද අද නම් මට ඇතිවෙන තුරු ඇවිදින්න රස රස පලතුරු කන්න ඇතිවෙනකම් සෙල්ලම් කරන්න පුළුවන්.



එසේ කියමින් ඔහු නටමින් සිංදු කියමින් නොදැනීම වනයේ හුඟක් දුරට ඇවිදන් ගියා.

හ්ම්.... මට නම් දැන් හරිම මහන්සියි තවත් නම් මට ඇවිදින්න බෑ.මට දැන් ගෙදර යන්න ඕනි යැයි අලි පැංචා හිතුවා . ඔහු ආපසු හැරී බැලුවා.අනේ, ඒ මේ අනිත් පාරවල් රැසක් දිස් වුණා. තමා ආ පාර මොකක්දැයි සොයා ගැනීමට පචා අපහසු වුණා.



අලි පැංචා ම හයියෙන් අඬන්න ගත්තා.

අම්මේ.... තාත්තේ..... කෝ ඔයාලා අනේ මට ගෙදර යන්න ඕනි.

හි.......හි.......හි.......



එතැනින් ගිය මී පැංචාට මේ අඬන ශබ්දය ඇසුනා. ඔහුට මේ පුංචි අලි පැංචා ගැන ගොඩක් දුක හිතුනා. ඇයි යාළුවේ මේ අඬන්නේ මී පැංචා අලි පැංචාගෙන් විමසුවා.

අනේ මගේ අම්මයි තාත්තයි ඔයා දැක්කාද? මං අතරමං වෙලා .... මට එයාලා ළඟට යන්න ඕනි. අලි පැංචා මී පැංචාට කීවා.



හරි යාළුවේ ඔයා කලබල වෙන්න එපා මං දැක්කා මිට ටිකක් නුදුරින් නැතිවුණා පැටවකු සොයන අලි දෙදෙනෙක් යමු යමු හනිකට මං ඔබව එතනට ඇරලන්නම්. මී පැංචා අලි පැංචාට කීවා.

අලි පැංචාගේ බිය ටිකක් තුරන් වී පුංචි සිනහවක් මුවඟට නැගුණා. දෙදෙනා කැටුව අලි දෙමාපියන් සිටිනා තැනට ළඟා වුණා.



පුංචි අලි පැටවා සතුටින් දිව ගොස් තම දෙමාපියන් වැළඳගත්තා. ඒ විතරක් නොවේ එයාලගෙන් සමාවත් ඉල්ලුවා.ඔවුන් තම පැටවාට අවවාද කොට සමාව දී ආදරයෙන් කරුණු පහදා දී මී පැටවාටත් ස්තූති කළා.



ආයෙනම් කවදාවත් මේ අලි පැටියා දෙමාපියන්ට අකීකරු වුණේ නෑ. තම දෙමාපියන් කියන දෙයින් පිට කිසිවක් කලෙත් නෑ. එදා පටන් ඔහු හොඳ දරුවෙකු ලෙස කල් ගෙව්වා.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023-10-20